# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## නාට්‍ය හා රංගකලාව

50 S I

## අ.පො.ස. (සා/පෙළ) පෙරහුරු ප්‍රශ්න පත්‍රය 2022 (2023)

### 11 ශ්‍රේණිය

විභාග අංකය :- කාලය: පැය යි.

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
පහත දැක්වෙන පද්‍ය හා ගද්‍ය පාඨ ඇසුරින් අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A
උගෙ කාරිය උඹ පැලපොල් වනසනවා
මගෙ කාරිය මම පැල්පොල් සිටුවනවා
සිතු කාරිය සිතු දේ සාදා දෙනවා
උඩුවේරිය දෙවි උඹරට හෙන දෙනවා

B
ලප නොමවන් සඳ සේ සොමි ගුණෙනා
ආදර දිනනා සිසු සැවොමා...

C
අනේ ගුරුන්නාන්සේ - මේ කණ්ණාඩියෙන් මොකුත්ම පේන්නේ නැනේ.. ?

D
නැකත් බලති දොළසත් දෙවියන් නමට
කොතෙක් පාලි කෙරුවත් නැත සිත සතුට
මෙතෙක් කර දොලස ආතුර රැකීමට
ඇතෙක් සොයා බැඳලා දෙමි පඬුරකට

E
ශ්‍රියා මනමත් වී මාගේ දැකලා - උන්මාද වේවි හර්දේ....

01. එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ නාට්‍යධර්මී නාට්‍යයක පද්‍ය කණ්ඩයට සම්බන්ධ වන්නේ,
1. A ය. 2. B ය. 3. C ය. 4. D ය.

02. කොහොඹා කංකාරි ශාන්තිකර්මය හා සම්බන්ධ වන්නේ,
1. A ය. 2. B ය. 3. C ය. 4. D ය.

03. රටයකුම ශාන්තිකර්මය හා සම්බන්ධ වන්නේ,
1. B ය. 2. C ය. 3. D ය. 4. E ය.

04. නූර්ති නාට්‍යයට අයත් පද්‍ය කණ්ඩය අයත් වන්නේ,
1. A ය. 2. B ය. 3. C ය. 4. E ය.

05. මඩු ශාන්තිකර්මය හා සම්බන්ධ වන්නේ,
1. A ය. 2. C ය. 3. D ය. 4. E ය.

- නිවැරදි පිළිතුර තෝරන්න.

06. චරිත නිරූපණයකදී වඩාත්ම සැලකිලිමත් විය යුත්තේ,
1. රංග වස්ත්‍ර හා අංග රචනය පිළිබඳව ය.
2. අභිනය හා සංවාද භාවිතය පිළිබඳව ය.
3. රංග භූමිය හා ආලෝකකරණය පිළිබඳව ය.
4. බාහිර පෙනුම සහ කටහඬ පිළිබඳව ය.

07. රංගාලෝකයේ පරමාර්ථය වන්නේ,
1. ප්‍රේක්ෂක අවධානය දිනා ගැනීමයි.
2. විවිධ වර්ණ භාවිතා කිරීමයි.
3. නළු කාර්යය පහසු කිරීමයි.
4. වේදිකාවේ අඳුර පළවා හැරීමයි.

08. රංග වින්‍යාසය නිර්මාණයේ දී වඩාත් වැදගත් වන්නේ,
1. ප්‍රබල අර්ථයක් සහ දෘෂ්‍ය රූපයක් මැවෙන අයුරින් නිර්මාණය කිරීමයි.
2. නළු නිළියන් සියලුදෙනා එකවර වේදිකාවේ ස්ථානගත කිරීමයි.
3. ගායනය සඳහා නළු නිළියන් යොදා ගැනීමයි.
4. දේශීය නර්තනාංගයන් යොදා ගැනීමයි.

09. නාට්‍ය සංගීතය නිර්මාණය කිරීමේ දී
1. රංගය අභිබවා යා යුතුය.
2. සජීවී සංගීතය පමණක් භාවිතා කළ යුතුය.
3. නාට්‍යයේ තේමාවට උචිත විය යුතුය.
4. නාට්‍යයේ විචිත්‍රත්වය මූලික අරමුණ විය යුතුය.

10. පිළිකුල්බව, පුස්තක, අංගචලන සහ ගද්‍ය සංවාද යනාදිය පිළිවෙළින් අයත්වන අභිනය ඇතුළත් වරණය වන්නේ,
1. ආංගික, වාචික අභිනය , සාත්වික අභිනය, ආහාර්ය අභිනය.
2. සාත්වික අභිනය, ආහාර්ය අභිනය, ආංගික අභිනය, වාචික අභිනය.
3. සාත්වික අභිනය, ආංගික අභිනය, ආහාර්ය අභිනය, වාචික අභිනය.
4. ආංගික අභිනය, ආහාර්ය අභිනය, සාත්වික අභිනය, වාචික අභිනය.

11. බෞද්ධ පූජා කර්මයක් නොවන්නේ,
1. සති පිරිත් 2. ආලවක දමනය 3. මහින්දාගමනය 4. සූවිසි විවරණය

12. නිර්මිත චලන යනු,
1. පෙර පුහුණුවෙන් ඉගෙන ගන්නා රංග කාර්යයකි.
2. රංග ක්‍රීඩා මගින් ප්‍රවීණත්වයට පත්වන ක්‍රියාකාරකමකි.
3. මනා පෙළගැස්මකින් යුතු රිද්මයානුකූල ක්‍රියාවකි.
4. පරිකල්පන ශක්තිය මෙහෙයවා කරනු ලබන ක්‍රියාකාරකමකි..

13. කිට්සන් පහන් ආලෝකය භාවිතයට යොදාගන්නේ,
1. නූර්ති සඳහා 2. කෝලම් සඳහා 3. නාඩගම් සඳහා 4. සොකරි සඳහා

14. සිංහලේ මුල්ම නාඩගම ලෙස හැඳින්වෙන්නේ,
1. ඇහැළේපොල නාඩගම 2. හරිස්චන්ද්‍ර නාඩගම
3. බ්‍රම්පෝඩ් නාඩගම 4. බැලසන්ත නාඩගම.

15. අභිරූපණ ශිල්පියා,
1. චරිත ස්වභාවය ඉස්මතු වන පරිදි රංග වස්ත්‍ර භාවිතා කරයි.
2. අතිශයෝක්තියෙන් සහ රිද්මයානුකූලව චලන භාවිතා කරයි.
3. රංග භාණ්ඩ භාවිතා කරයි.
4. චරිත ස්වභාවය ඉස්මතු වන පරිදි අංග රචනය යොදාගනී.

- පහත දැක්වෙන වගුව ඇසුරින් අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| මුල් කෘතිය | රචකයා | අනුවතර්න කෘතිය | අනුවර්තකයා |
|---|---|---|---|
| ද ග්ලාස් මෙනාජරි | ටෙනිසි විලියම්ස් | A | හෙන්රි ජයසේන |
| ද රෙස්පෙක්ටබල් ප්‍රොස්ටිටියුට් | B | නම්බුකාර අභිසරුලිය | උදය මල්වලවආරච්චි |
| ද මැරේජ් | නිකොලායි ගොගොල් | කපුවා කපෝති | C |
| D | රේකුනි | රෝමය ගිනි ගනී | බන්දුල විතානගේ |
| සික්ස් කැරැක්ටර්ස් ඉන් සර්ච් ඔෆ් ඈන් ඕතර් | ලුයිජි පිරැන්ඩෙලෝ | E | සුගතපාල ද සිල්වා |

16. ඉහත වගුවේ A කොටුවට ඇතුළත් විය යුතු අනුවර්තන කෘතිය වන්නේ,
1. හිතහොඳ අම්මණ්ඩි
2. අහස්මාළිගා
3. සකලජන
4. වෙස් මුහුණු

17. ඉහත වගුවේ 'B' කොටුවට ඇතුළත් විය යුතු රචකයාගේ නම වන්නේ,
1. රේකුනි
2. නිකොලායි ගොගොල්
3. ඇන්ටන් චෙකෝව්
4. ෂෝන් පෝල් සාත්‍රෙ

18. ඉහත වගුවේ 'C' කොටුවට ඇතුළත් විය යුතු අනුවර්තකයාගේ නම වන්නේ,
1. ඊ.ආර්. සරත්චන්ද්‍ර
2. රංජිත් ධර්මකීර්ති
3. විජිත ගුණරත්න
4. සුගතපාල ද සිල්වා

19. ඉහත වගුවේ 'D' කොටුවට ඇතුළත් විය යුතු මුල් කෘතියේ නම වන්නේ,
1. යෙර්මා
2. ඉක්නෙව්ටාඉ
3. රන් ෆෝර් යුවර් වයිෆ්
4. ද ප්‍රොපෝසල්

20. ඉහත වගුවේ 'E' කොටුවට ඇතුළත් විය යුතු අනුවර්තන කෘතියේ නම වන්නේ,
1. හිතහොඳ අම්මණ්ඩි
2. හරිම බඩු හයක්
3. බෙර හඬ
4. මූදු පුත්තු

- පහත දැක්වෙන ඡායාරූප ආශ්‍රයෙන් 21 සිට 25 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.


A


B


C


D


E

21. සිංහල නාට්‍ය කලාවේ නාට්‍ය ධර්මී සම්ප්‍රදායේ පුරෝගාමියා වන්නේ,
1. A 2. C 3. D 4. E

22. සොඳුරු ආඥාදායකයා නමින් කෘතියක් රචනා කරන ලද්දේ,
1. A 2. B 3. C 4. E

23. ජන කරළිය නමින් ජංගම රඟමඬල ආරම්භකළ පුරෝගාමියා වූයේ,
1. B 2. C 3. D 4. E

24. කුවේණි , ජනේලය , හුණුවටය වැනි නාට්‍ය නිර්මාණය බිහි කළ නාට්‍යකරුවා වන්නේ,
    1. A    2. B    3. C    4. D

25. හාස්‍ය රංගනය සඳහා ප්‍රසිද්ධියක් ඉසිලුනේ,
    1. A    2. B    3. C    4. D

- පහත දැක්වෙන වෙස් මුහුණු දෙක ආශ්‍රයෙන් 26 සහ 27 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B

26. ඉහත A සහ B වෙස් මුහුණු පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ,
    1. A සන්නි මුහුණකි  B කෝලම් මුහුණකි.
    2. A කෝලම් මුහුණකි  B සන්නි මුහුණකි.
    3. A සහ B දෙකම සන්නි මුහුණු දෙකකි.
    4. A සහ B දෙකම කෝලම් මුහුණු දෙකකි.

27. ඉහත A සහ B වෙස් මුහුණු පිළිවෙළින් දැක්වෙන්නේ,
    1. කොර සන්නිය , ජස කෝලම    2. හේවා කෝලම , මුදලි කෝලම
    3. අමුක්කු සන්නිය , ආරච්චි කෝලම    4. අමුක්කු සන්නිය , හේවා කෝලම.

- ප්‍රශ්න අංක 28 සිට 32 දක්වා ප්‍රශ්න සඳහා පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.

| ක | ග | ජ | ට |
|---|---|---|---|
| අඹ විදමන | ගුරුගේ මාලාව | යුගාසන බණ | සන්නියකුම |
| රාම මැරීම | උඟුරා යක්කම | දොරකඩ අස්න | සූනියම් යාගය |
| මරා ඉපැද්දීම | ගබඩා කොල්ලය | ආලවක දමනය | රිද්දි යාගය |

28. උඩරට ශාන්තිකර්මයට අයත් නාට්‍යමය ලක්ෂණ ඇතුලත් කාණ්ඩය වන්නේ,
    1. ක    2. ග    3. ජ    4. ට

29. සබරගමු ප්‍රදේශයේ පවත්වනු ලබන ශාන්තිකර්මයක නාට්‍යමය ලක්ෂණ අඩංගු කාණ්ඩය වන්නේ,
    1. ක    2. ග    3. ජ    4. ට

30. පත්තිනි දෙවියන් පුද ලබන නාට්‍යමය අවස්ථාවක් දැක්වෙන කාණ්ඩය ,
    1. ක    2. ග    3. ජ    4. ට

31. බෞද්ධ පූජාකර්ම අඩංගු වන කාණ්ඩය වන්නේ,
    1. ක    2. ග    3. ජ    4. ට

32. ගර්භ සංරක්ෂණය අරමුණු කොටගත් ශාන්තිකර්මයක් දක්නට ලැබෙන කාණ්ඩය වන්නේ,
    1. ක    2. ග    3. ජ    4. ට

33. නළුවකු සතුව තිබිය යුතු ගුණාංග හා ලක්ෂණ අතරට අයත් නොවන්නේ,
1. සහජ හැකියාව
2. සබකෝලය දුරුකළ තැනැත්තකු වීම.
3. සුන්දර රූ සපුවක් තිබීම ය.
4. මනා ධාරණ ශක්තියක් තිබීම ය.

34. ආලෝක පහනක් නොවන්නේ,
1. අල්ට්‍රාවයලට් ලාම්පුව ය.
2. වර්ණ චක්‍රය
3. ධාරාලෝක පහන ය.
4. යොමු පහන ය.

35. සමාරෝපය යනු,
1. යම් දෙයක් ඒ අයුරින් ම සිදු කිරීමයි.
2. සිනමාව තුළ වැදගත් සංකල්පය යි.
3. බාහිර හා අභ්‍යන්තර වශයෙන් කොටස් දෙකකි.
4. අනුශාංගික ශිල්පීන් විසින් ප්‍රගුණ කළ යුත්තකි.

36. නාට්‍ය පෙළ තුළින් නළුවා වෙත සපයනු ලබන මූලික උපදෙස් වන්නේ,
1. සංවාදය 2. රංග විධානය 3. සෝදුපත් ය. 4. රංග වින්‍යාසයයි.

37. කරළිය නමැති රංග භූමිය දක්නට ලැබෙන්නේ,
1. නාඩගම් කලාවේ ය. 2. සොකරි නාට්‍යයේ ය.
3. කෝලම් නාටකයේ ය. 4. නූර්ති කලාවේ ය.

38. රූපණ ශිල්පියෙකුට දෑස්වල සබඳතාවය පවත්වා ගැනීම ඉතා වැදගත් ය. මේ සඳහා ප්‍රගුණ කළ යුතු අභ්‍යාසයකි,
1. ශිථිලකරණ අභ්‍යාසය 2. සංගුණක අභ්‍යාසය
3. තාපන අභ්‍යාසය 4. දර්පණ අභ්‍යාසය

39. නාට්‍යයක් වේදිකාගත වන විට එහි මූලිකත්වය හිමිවන්නේ,
1. රූපණ ශිල්පියාට ය. 2. වේදිකා පාලකවරයාට ය.
3. රංගාලෝක ශිල්පියාට ය. 4. අධ්‍යක්ෂකවරයාට ය.

40. නාට්‍යයක් නිර්මාණය කළ පසු එහි වැදගත්කම රඳා පවතින්නේ,
1. අධ්‍යක්ෂකගේ හා නළු නිළියන්ගේ දැඩි කැපවීම මතය.
2. අනුශාංගික ශිල්පීන්ගේ කැපවීම මතය.
3. ප්‍රේක්ෂක ප්‍රතිචාර මත ය.
4. නාට්‍යය දිග හැරෙන ලය මත ය.

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## නාට්‍ය හා රංගකලාව

50 | S | II

## අ.පො.ස. (සා/පෙළ) පෙරහුරු ප්‍රශ්න පත්‍රය 2022 (2023)

## 11 ශ්‍රේණිය

විභාග අංකය :- කාලය: පැය දෙකයි

- පළවෙනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. දික්තල කාලගෝල නාට්‍ය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (ල.2)
    i. දික්තල කාලගෝල නාට්‍යයට පදනම් කරගත් ග්‍රන්ථය හා ජාතක කතාව නම් කරන්න. (ල.2)
    ii. මෙම නාට්‍යයේ ප්‍රධාන ගැටුම ඇති වන්නේ කවුරුන් අතර ද? (ල.2)
    iii. දික්පිටියා මහෞෂධ පඬිතුමා ඉදිරියේ දික්තලාගේ නම ලෙස දක්වන ව්‍යාජ නම කුමක් ද? (ල.2)
    iv. මෙම නාට්‍යයේ සංගීතය සඳහා භාවිතා කළ සංගීත භාණ්ඩ මොනවා ද? (ල.2)
    v. ''සොබනා ගඟේ ගං ඉවුරේ පැලක ඉඳ - හඬනා කඳුළු ගඟ පහළින් ගියෙ කිම ද?'' මෙම කවිය ගායනා කරන පාත්‍රයා නම් කරන්න. (ල.2)
    vi. මෙම නාට්‍යයේ රංගාලෝක නිර්මාණ ශිල්පියා කවුරුන් ද? (ල.2)

02. i. අනවින, කොඩිවින, හූනියම් දුරු කරගැනීම සඳහා පහතරට ප්‍රදේශයේ සිදු කරන ශාන්තිකර්මය නම් කරන්න. (ල.2)
    ii. එහි අන්තර් රංග අවස්ථා දෙකක් නම් කරන්න. (ල.2)
    iii. නාඩගම් රංග භූමිය ඇඳ නාඩගම් රංග ශෛලියේ ලක්ෂණ තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.(ල.8)

03. i. වේදිකා නාට්‍ය සඳහා රංගාලෝකය අවශ්‍ය වන්නේ ඇයි ? (ල.2)
    ii. රංගාලෝකය සපයා ගැනීම සඳහා අතීතයේ දී භාවිතා කළ උපක්‍රම දෙකක් පැහැදිලි කරන්න. (ල.4)
    iii. රංගාලෝක ශිල්පියා නාට්‍යයට ආලෝකය සැපයීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු තුනක් සඳහන් කරන්න. (ල.6)

04. i. නාට්‍යධර්මී හා ලෝකධර්මී නාට්‍ය දෙකක් නම් කරන්න. (ල.2)
    ii. එම නාට්‍ය නිර්මාණය කළ රචකයන් දෙදෙනා නම් කරන්න. (ල.4)
    iii. නාට්‍යධර්මී හා ලෝකධර්මී නාට්‍ය ශෛලීන් දෙක වෙන් වෙන් වශයෙන් විස්තර කරන්න. (ල.6)

05. i. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගැමි නාටක කීය ද? ඒ මොනවා ද? (ල.2)
    ii. ඉන් එක් ගැමි නාටකයක උපත් කතාව විස්තර කරන්න. (ල.4)
    iii. ඔබ විස්තර කළ ගැමි නාටකයේ රංග ශෛලිය හා චරිත තුනක් පැහැදිලි කරන්න. (ල.6)

06. i. කැළණි පාළම හා විකෘති නාට්‍ය නිර්මාණය කළ නාට්‍යකරුවන් නම් කරන්න. (ල.2)
    ii. එම නාට්‍ය කරුවන්ගේ වෙනත් නාට්‍ය නිර්මාණ දෙක බැගින් ලියා දක්වන්න. (ල.4)
    iii. ඉහත ඔබ සඳහන් කළ එක් නාට්‍ය කරුවෙකු තෝරාගෙන ඔහුගෙන් ලාංකීය නාට්‍ය කලාවට ඉටු වූ සේවාව පැහැදිලි කරන්න. (ල.6)

07. පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කරගෙන නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කරගත හැකිය.

'' කසුන් දහම් පාසල් හා සැම දිනකම පාසල් යන ගුණ යහපත් ළමයෙකි. නමුත් ඔහුගේ මිතුරා වන දසුන් අනවශ්‍ය ලෙස මුදල් වියදම් කරන, නිතරම දුරකථන භාවිතය සඳහා හුරු වූ හිතුවක්කාර ළමයෙකි. මේ දෙදෙනා හොඳ මිතුරන් වන අතර දිනක් ගමනක් යන විට දී බිම වැටී තිබෙන දුකරථනයක් අහුලා ගනිති. දුරකථනයට කළ යුත්තේ කුමක් දැයි දෙදෙනා වාද කරන අතර එතැනට පොලිස් නිලධාරියෙක් පැමිණෙයි.'

i. පසුබිම , කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සහ සංවාද රචනා කිරීම සඳහා (ල.4)

ii. චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථා ගොඩනැගීම සඳහා (ල.4)

iii. කුතුහලය දක්වා නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවන් නිර්මාණය කිරීම සඳහා (ල.4)